පසු පිටුවෙන් (අදිසි)

බොහෝ වේලාවකට පසුව ය.

"වැඩි දෙනෙක් කවදාවත් තේරුම් ගන්නෙත් නැහැ සුනන්ද අයියා.. දහස් ගණනින් මනාප දීලා මිනීමරුවන්ව නැවත නැවත පාර්ලිමේන්තු යවන්නෙ යුක්තිය තේරුම් නොගත්ත මිනිස්සු ගණාන වැඩි නිසා.. එහෙමත් නැත්නම් වැඩි දෙනෙක් මෝඩයො නිසා.." මේසය මතින් සිය කාරයේ යතුර අතට ගන්නා කුසල් කෑම කාමරයෙන් පිටව යන අතර කියයි. විනාඩි කීපයකට පසු ඔහුගේ වාහනය පිටව යන හඬ ඇසෙයි.

වින්ධ්‍යා තවමත් කල්පනාවකට වැටී සිටින සුනන්ද දෙස බලන්නේ අපූරු සිනාවක් රැඳුණ මුහුණින් ය.

"මේ පළවෙනි වතාවට නේද ඡන්දෙ නොදැම්මෙ..?" ඕ සිය සුරත මේසය මත රැඳි ඔහු සුරත මත තබා අසයි. ඔහු පිළිතුරක් දෙනු වෙනුවට සිනා සී ඇය දෙස බලයි.

"ඇයි ඉතින් ඡන්දෙ දාන්න කොළඹ ගියේ නැත්තෙ...?" ඕ නැවත අසන්නේ ඔහු අවුස්සා ගන්නට ය. ඔහු දෝතින්ම ඇගේ සුරත ගෙන ඇය දෙස බලයි.

"මගේ ඡන්දෙ තියෙන්නෙ මෙහෙ නිසා.." ඔහු සෙමින් කියයි. ".. අපි දෙන්නම හවස් වෙලා කොළඹ යමු ද..? මට අම්මල බලන්න ඕනෙ.."

00000

අනුර සිය පුටුවේ පසුපසට බර වුනේ දෑතින්ම සිය ගෙල පිටුපස සම්බාහනය කර ගනිමින් ය. බරපතල සිදුවීමකින් තොරව ඡන්ද දවස ගතවීම ඔහුගේ සිතට සැනසුමක් ගෙනෙයි. දහවල් කාලයේ ඡන්ද මධ්‍යස්ථාන දෙක තුනක ඇතිවන්නට ගිය සුලු ගැටුම් කීපයක් වළක්වා ගන්නට ඔහුට හැකි වූයේ කල් තබා ඒ සඳහා සූදානම්ව සිටි නිසා ය.

නීති විරෝධී ලෙස ඡන්දය දමන්නට ගොස් අල්ලා ගනු ලැබූ මිනිස්සු දහ දොළොස් දෙනෙක් තවමත් ඔහුගේ කාමරය ඉදිරියේ බංකුවේ වාඩි වී සිටිති. ඔවුන් බේරා ගන්නට දහවල සිට විවිධ දේශපාලකයන් දැරූ උත්සාහය උපක්‍රමශීලීව වළක්වාගන්නට ද අනුරට හැකි විය. ඔවුනතරින් වඩාත් ආවේග ශීලී ලෙස හැසිරුණ සමහරකු ඡන්දයෙන් දිනූ පසු තමා වන්නියට මාරු කර යවන බවට වහසි බස් දෙඩූ අයුර ද සිහිපත් වන විට පොලිස් පරීක්ෂකවරයා ගේ මුවේ මතුවන්නේ අවඥා සහගත සිනාවකි. තමාගේ රැකියාව සෑම මොහොතකම අවදානමක රැඳී තිබෙන බව ඔහු දනියි.

පියසිරි රාළහාමි දුම් දමන කෝපි කෝප්පයක් ගෙනැවිත් අනුරගේ මේසය මත තබයි. "සර්ට මහන්සියි නේද..?" ඔහු අසන්නේ අනුර ගේ වෙහෙසින් බර මුහුණ දෙස බලමින් ය.

අනුර කතාවකින් තොරව කෝපි කෝප්පය අතට ගෙන තොල ගායි. ".. මරු කෝපි එක.. පියසිරි ජුවර් එකටම පොලිසියට බැඳෙන්න කලින් හෝටලේක වැඩ කරලා තියෙනවා.." ඔහු සිනාසෙමින් කියයි.

ඡන්ද ප්‍රතිඵල නිකුත් කිරීම දැනටම ආරම්භ වී ඇත. නිල මැදිරියේ කෙළවරක තැබූ කුඩා රූපවාහිනී යන්ත්‍රයේ හඬ වැඩි කරන ලෙස අනුර පියසිරිට හස්ත සංඥාවෙන් කියයි.

"මෙහෙ ප්‍රතිඵල එනකොට උදේ වෙයි සර්.."

".. තව පැය බාගෙකින් විතර අපි ආයෙම සැරයක් ඡන්ද ගණින තැනට ගිහින් එමු පියසිරි.."

සැරයන් බණ්ඩාර ස්ථානාධිපතිවරයා ගේ කාමරයට ඇතුල්වන්නේ කලබලයෙනි.

"මොකද..? තවත් ඡන්ද ප්‍රතිඵලයක් ද..?"

අනුර අසන්නේ සිනාසෙමින් ය.

"විහිලු කරන්න එපා සර්.. රේඩියෝ මෙසේජ් එකක්.. ගල්වල පාරෙ වෙල ළඟ ටයර් එකක බොඩියක් පිච්චෙනවලු.."

අනුර වහා අසුනින් නැගී සිටියි.

"කෙල්ලෙක්ලු සර්.. "

*මීළඟ කළාපයට*




# නෙතින් නොදුටු රණ විරුවන් වෙනුවෙන් නර්තනයෙන් ශිල්ප පෙන්වූ විප්‍රවාසී අපේ දරුවෝ

"දිලෙන රතැඟිලි කිරණ විලසින් අනෙක බරණින් සැරසිලා"
"ලවම් එක රට පූර්ණ නූලක් සිරස ජටිලය බඳවාලා"

බෙර පදවැල්වලින් ගලා එන රිද්මයට, ඔවුන් මුමුණන්නේ වඩිග පටුන නර්තනයේ එන ගී වැලකි. තවත් තැනක ගැටවර වියේ පසුවන දරු දැරියන්ගේ පා සළඹේ ගිගිරි සැළෙන්නේ කොවුලා වන්නමටය. නැතිනම් මයුරා වන්නමටය. තවත් කොනක කුඩා දරුවන් පිරිසක් උඩරට නැට්ටුවන් විලස සැරසී බෙර පදයට පා තබන්නේ බලා සිටින දෙමව්පියන්ගේ සිත් සතන් කුල්මත් කරමිනි. තාලම්පටේ හඬත් ඒ සමඟම තවත් දරුවන් දෙදෙනෙකු ගැසූ කරණමත් නිසා සියල්ලන්ගේම නෙත් ඒ දෙසට ක්ෂණිකව දිව යයි. සියල්ලෝම සතුටෙන් අත් පොළසන් දෙති. එහෙත් ගැසූ කරණම නිසා පාදය පෙරළීමෙන් ඇය ඇවිදින්නේ තරමක් අපහසුවෙනි. සියල්ලෝම එකට එකතු වී ඇගේ පාදයේ සුවයට පිළියමක් සොයන්නේ ප්‍රසංග යට පෙර කෙසේ හෝ පාදය සුව කරගත යුතුයැයි යන තිර අදිටනිනි. එහෙත් ඇය සුළු වේලාවකින් "නෑ මට පුළුවන්" කියා සුන්දරව සිනාසෙමින් ඇවිදින්නට උත්සාහ කරන්නේ සියලු වේදනාවන් අමතක කර දමමිනි. තවත් පිරිසක් වෙහෙස මහන්සි වී දහබිඳු හෙළන තම සහෝදර පිරිසට සිසිල් පැන්වලින් සංග්‍රහ කරති. නර්තනයන් පුහුණුවන ශාලාවේ පිටුපස කොටසක තවත් දෙමව්පියන් පිරිසක් එකට එකතු වී නර්තනවලට අවශ්‍ය ඇඳුම් ආයිත්තම්, ආභරණ කඩිනමින් සකස් කරති. මිදුලේ ගස් සෙවණක තවත් දරුවන් පිරිසක් පොත පතේ වැඩේ යෙදෙන්නේ තම නර්තන වාරය එනතුරුය. ඒ උදය වරුවේ සරසවි අධ්‍යාපනය හදාරන දරුවන්ය.

එලෙසම ඒ දිනවල පැසැල් නිමවූ තවත් දරුවන් පිරිසක්, කෙළින්ම දුවගෙන ආවේ නර්තනයන් පුහුණුවෙන ශාලාවටය. ඒ ඔවුන්ගේ සිත් සතන් නිරන්තරයෙන්ම බැඳී තිබුණේ "සංකලන" සමඟයි. වෛද්‍ය විද්‍යාලය, සරසවිය, රැකියාව, පාසැල මේ සියල්ල මදකට හෝ නතර කර, මුව හසරැලි නගා ගෙන ඔවුන් කළ වෙහෙස මහන්සියේ ප්‍රතිඵල කොතෙක්දැයි යන්න අපිට දැකගත හැකි වූයේ සැබෑම "සංකලන" දුටුවිටය.

දිවයිනෙන් සැතපුම් දහස් ගණනක් ඈතින් පිහිටි ඕස්ට්‍රේලියා මහාද්වීපයේ සිඩ්නි නුවර ශ්‍රී ලාංකික දරු දැරියන්ගේ නර්තන පෙළහර, සංකලන ප්‍රසංගය පසුගිය ඔක්තෝම්බර් මස 24 දින සවස කුරුංගායි විශ්ව විද්‍යාලීය රංග ශාලාවේ ප්‍රසාංගික විය. එය සැමගේම නෙත් සිත් පහන් කළ ආනන්දනීය ප්‍රසංගයක් බවට පත් වූයේ ඒ අයුරිනි.

කිසිදිනෙක රණවිරුවන්, යුද්ධය, අවි ආයුධ, බිම් බෝම්බ සැබෑ නෙතින් නොදුටු ඒ දරුවන් රණවිරුවන් වෙනුවෙන් කළ කැපවීම සැබෑ මිනිස්කමේ නර්තනයක් ලෙස සංකේතවත් වනු ඇත. නොයෙක් වාර්ගික ජාතීන්, ආගම්, වර්ණයන්, භාෂාවන් මැද අකුරු කරන එම දරුවන් නොහඳුනන එක් දෙයක් ඇත්නම් ඒ වර්ගවාදයයි. තම දෙමව්පියන් උපන්, ජීවත් වුන රටේ මිනිසුන් වර්ගවලට බෙදී පොළව වෙනුවෙන් ඇන කොටාගන්නා කාලයේ ඔවුන්ට මෙය ප්‍රහේළිකාවක් වූයේ ලෝකයේ තවත් වර්ගයින් සමඟ එකට එකතු වී සමඟි සම්පන්නව ඔවුන්ද එකට අත්වැල් බැඳගෙන ජීවත් වෙන නිසාය. වර්ගයක් ජාතියක් පිළිබඳව ඔවුන්ට නොසිතෙන නිසාය. "ඇයි අපි වගේ ඒගොල්ලන්ට එකට ඉන්න බැරි " ඔවුන් නැගූ ප්‍රශ්නය එයයි.

තම සහෝදර ආබාධිත විරුවන් වෙනුවෙන්, ගුරුවරුන් දෙමව්පියන් හා එකට එක්ව මෙවැනි ප්‍රසංගයක් පැවැත්වීමට, ඔවුන් එක්වීම දෙමව්පියන් ලද භාග්‍යයකි. කුමන විෂයයන් හැදෑරුවත්, ශ්‍රී ලාංකික නර්තනය ප්‍රගුණ කරමින් ඔවුන් එය නිවැරදිව හැදෑරීම මෙම ප්‍රසංගය පිටුපස ඇති තවත් රහසකි. මුදල් පසුපස හඹායමින් මුදලට ශිල්ප විකුණන ලෝකයක "සංකලන" සැබෑ සෞන්දර්යාත්මක සිතුවම් පෙළක් වන්නේ ඒ නිසාය.

මෙම ප්‍රසංගයේ නර්තන ආචාර්යවරිය වූ මාලා අබේවික්‍රම ගුරුතුමිය, මීට වසර 30කට පමණ පෙර ලංකාවේ ප්‍රධාන බාලිකා පාසැල්වල නැටුම් ඉගැන්වූ දක්ෂ ආචාර්යවරියකි. ඇය දැන් වසර 30ක පමණ සිට සිඩ්නි නුවර දරු දැරියන්ට නර්තනය උගන්වන ගුරුතුමියයි. ඇය සමඟ දක්ෂ නර්තන ශිල්පිණියක් වූ රාජිණී ෆොන්සේකා සේම තවත් දක්ෂ නර්තන හා බෙර වාදන ශිල්පියෙකු වූ දිනේෂ් පෙරේරා ද එක් වී ඒ ත්‍රිත්වයේ මූලිකත්වයෙන් හා දෙමව්පියන්ගේ දායකත්වයෙන් උපන් සංකලන මෙපුර වේදිකාගත වූ වැඩිම ප්‍රේක්ෂක පිරිසක් සහභාගී වූ රණවිරුවන් වෙනුවෙන් කළ සාර්ථක ප්‍රසංග යකි. එසේම අප රටේ ප්‍රවීන සංගීතඥයන් දෙපළක් වූ රෝහණ වීරසිංහ හා ෂෙල්ටන් ප්‍රේමරත්න යන්ගේ නාද රටාවලින් සපැමිණි මිහිරියාව මෙම ප්‍රසංගයේ සාර්ථකත්වයට තවත් හේතුවක් විය.

තුරඟා වන්නම, මයුර වන්නම, කොවුලා වන්නම, ගිරි දේවි, සුද්‍ර මාත්‍රා, වෙස් නැටුම, වඩිග පටුන, සම්ප්‍රදායික බෙරපද නැටුම්, කාවඩි නැටුම් ඇතුළු ශ්‍රී ලාංකික උඩරට පහතරට නැටුම්වලින් පෝෂිත වූ මෙම ප්‍රසංග යේ හංසවිල, රූකඩ නැටුම හා ධීවර ගීතය අළුත් මගක් ගත් නැටුම් නිර්මාණයන් වේ. එහි නර්තන ලීලාව හා ඇඳුම් පැළඳුම්වලින් ලැබුණු ආකර්ෂණීය බව තුළින් ප්‍රේක්ෂකයන්ගේ සිත් සතන් අමන්දානන්දයට පත් වූ බව රහසක් නොවේ.

නෙතින් නොදුටු ආබාධිත විරුවන්, රට වෙනුවෙන් දිවිය කැප කළ අපේම දූ පුතුන් වෙනුවෙන්, විප්‍රවාසී දරුවන්ගේ පා සැලුණු සංකලන නර්තනය මව්රට වෙනුවෙන් කළ සැබෑම පරිත්‍යාගශීලී සංකලනයක් වන්නේ ඒ නිසාය. එයින් උපන් සතුට පිනක් බවට පත්වන්නේද ඒ නිසාය. සංකලන අප රටේ සැබෑ වීරයන් වෙනුවෙන් කළ "පුංචි තෑග්ගක් වේ."

**ලක්ෂ්මන් කොඩිතුවක්කු**

ඕස්ට්‍රේලියාවේ ජාතික පියයුරු පිළිකා පදනමේ පරයෙෂන සඳහා ආධාර පිනිස ලක්හඬ දිවාවිහරන මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද ආප්ප රාත්‍රියෙන් සහ ඊට පසුව ලැබුන මුල්‍යමය ආධාර වලින් ලද $ 4500/= මුදල **Springvale Neighbourhood House** හිදි පවත්වන ලක්හඬ දිවාවිහරන මධ්‍යස්ථානයේ සතිපතා හමුවේදි ජාතික පියයුරු පිළිකා පදනමේ බහු සංස්කෘතික ජනකොටසේ කළමනාකාරිනි Irene Ryder මහත්මියට ලක්හඬ මාධ්‍යායතනයේ සභාපති ගාමිනි ෆොන්සේකා මහතා විසින් භාරදෙන ලදි .

